---

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 මැයි 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.**

**1.2 මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ**

**(අ) වර්ෂය තුළ මිලදී ගන්නා ලද වටිනාකම රු. 139,400 ක්වූ පරිගණක 2 ක් ලැප්ටොප් පරිගණකයක් හා ප්‍රොජෙක්ටරයක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.**

**(ආ) පුස්තකාල හා පෙර පාසල් ගොඩනැගිලි 09 ක වටිනාකම ගණනය කර ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ඇතුලත් කර නොතිබුණි.**

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 64,431,417 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.3 බැංකු ගිණුම්**

**ලංකා බැංකුවේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ජංගම ගිණුම වෙනුවෙන් 2012 මැයි මාසයෙන් පසු බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.**

**1.3.4 නිරවුල් නොකළ ගිණුම්**

**වටිනාකම රු. 520,094 ක්වූ ගිණුම් ශේෂ 9 ක් වසර 1 ත් 15 ත් අතර කාලපරිච්ඡේදයක සිට නිරවුල් නොකර පැවතුණි.**

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,471,138 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,841,655 ක් විය.**

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

**සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිණි.**

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් අය වී නොතිබුණි.**

**2.2.3 වරිපනම් බදු**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) ප්‍රාදේශීය සභාවේ වරිපනම් බදු අය නොකරන අංකුඹුර හා බටුගොඩ කොට්ඨාශයේ සංවර්ධිත ප්‍රදේශ 7 ක් සඳහා වරිපනම් බදු අය කිරීමට 2010 අගෝස්තු 30 දිනැති මහා**

සභා රැස්වීමේ තීරණය පරිදි පළාත් පාලන කොමසාරිස් විසින් එම ප්‍රාදේශ වල වරිපනම් බදු අයකිරීමට සදහා අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද වරිපනම් බදු පැනවීම පිළිබද ගැසට් නිවේදනය 2012 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රමාද කිරීම හේතුවෙන් බදු අය කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ඉහත (අ) කරුණට අමතරව 2010 අප්‍රේල් 29 දිනැති මහ සභා රැස්වීමේදි අනුමත යෝජිත වරිපනම් බදු ප්‍රදේශ 7 ක් වරිපනම් බදු අයකිරීම සදහා 2010 ජුලි 16 දිනැති ගැසට් පත්‍රයේ පළ කර තිබුණද සභාව විසින් 2011 සහ 2012 වර්ෂ සදහා එම යෝජිත ප්‍රදේශවලින් වරිපනම් බදු අය නොකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු වරිපනම් ආදායමක් ලැබී නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරන ප්‍රදේශයන් සදහා වරිපනම් බදු අයකිරීම් ප්‍රතිශතය 2007 වර්ෂයේ ප්‍රතිශෝධනය කළ යුතු වුවත් 2013 මාර්තු 31 වන දිනටත් එවැන්නක් සිදු වී නොතිබීමෙන් වර්ෂ 6 තිස්සේ සභාවට ලබාගත හැකිව තිබූ වැඩිවන වරිපනම් ආදායම් අහිමි වී තිබුණි.

**2.2.4 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

-----------------------------

පහත සදහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශිය සභා බල ප්‍රෙද්ශය තුල සම්ප්‍රේෂණ කුළුණු 18ක් ස්ථාන ගත කර තිබුනද එයින් කුළුණු 8 ක් ඉදිකිරීම සඳහා සභා අනුමැතිය ලබා ගෙන තිබුණි. මේ අනුව සම්ප්‍රේෂණ කුළුණු 10 ක් අනවසරයෙන් ස්ථාන ගත කර තිබුණ අතර මෙයින් කුළුණු 09 කට අදාලව 2008 වර්ෂයේ සිට ආදායම් අය නොකිරීම හේතුවෙන් සභාවට රු. 135,000 ක පමණ මුදලක් අහිමි වී තිබුණි.

(ආ) උඩුහිගුල්වල ස්ථානගත කර තිබූ භාරති එයාටෙල් පුද්ගලික සමාගමට අයත් සම්ප්‍රේෂණ කුළුණින් 2009 වර්ෂයේ සිට ව්‍යාපාර බදු අයනොකිරීම හේතුවෙන් රු. 12,000 ක පමණ ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) ගොඩහේන ස්ථානගත කර තිබූ මොබිටෙල් සමාගමට අයත් කුළුණ වෙනුවෙන් 2009 වර්ෂයේ සිට ව්‍යාපාර බදු අය කර නොතිබුණි.

(ඈ) බොක්කාවල ස්ථානගත කර ඇති හච්සන් ටෙලිකොමියුනිකේෂන් (පුද්) සමාගමට අයත් කුළුණ වෙනුවෙන් 2012 වර්ෂය සදහා ව්‍යාපාර බදු අයකර නොතිබුණි.

(ඉ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ පනත ක්‍රියාත්මක වන බලසීමාව තුල සම්ප්‍රේෂණ කුළුණු වල උස අනුව ගාස්තු අයකළ යුතු වුවද, එම පනත ක්‍රියාත්මක නොවන ප්‍රදේශ වලට අදාල කුළුණුවලට අවසර ලබා දිමේදි සභාවේ අභිමතය මත නිශ්චිත මුදලක් අයකර සභාවේ ආදායම වැඩිකර ගත හැකි වුවද ඒ සම්බන්ධව අවධානය යොමු වී නොතිබුණි.

(ඊ) සම්ප්‍රේෂණ කුළුණු වලට අදාලව ව්‍යාපාර බදු වශයෙන් වර්ෂයකට රු. 3,000 ක මුදලක් පමණක් සභාව විසින් අයකර තිබුනද, කුළුණු මගින් එම සමාගම් වාර්ෂිකව විශාල ආදායමක් උපයයි. මේ හේතුවෙන් සමහර පළාත් පාලන ආයතන සභා තිරණ මත වාර්ෂික බදු වශයෙන් සැලකිය යුතු මුදලක් අයකිරිම් කරනු ලබන අතර එමගින් සභාවට විශාල ආදායමක් එකතු කර ගැනිමට අවස්ථාව උදා වී තිබුණ ද මේ සම්බන්ධව සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

## 2.2.5 පරිසර බලපත්‍ර

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රේගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත ව්‍යාපෘති සඳහා පරිසර බලපත්‍ර ලබා ගත යුතු බවට අවධාරනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2013 මාර්තු 21 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී ව්‍යාපාරික ආයතන 91 ක් වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබා නොගැනිම හේතුවෙන් සභාවට අයවිය යුතු රු .673,400 ක පමණ මුදලක් අහිමි වී තිබුණි.

## 2.3 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

2000 වර්ෂයේදි රු. 4,200,000 කට මිලදි ගන්නා ලද අංක GB-7199 දරන බැකෝ යන්ත්‍රය 2011 දෙසැම්බර් 01 දින සිට ධාවනයෙන් ඉවත් කර තිබිම නිසා එදින සිට වර්ෂයකට අධික කාලයක් මුළුල්ලේ නිශ්ක්‍රියව පැවතුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටු කරන ලද මාර්ග සංවර්ධන ඉදිකිරීම් පිළිබඳව සිදුකළ භෞතික පරීක්ෂණයන් අනුව එම ඉදිකිරීම් නියමික ප්‍රමිතීන්ට අනුව ඉටුකර නොතිබූ බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| | කොන්ත්‍රාත්තුව | ඇස්තමේන්තුගත මුදල | වැඩ විෂයය |
|---|---|---|---|
| | | රු. | |
| **(i)** | ඔවිස්ස දෙහිගහමඩ මාර්ගය (I අදියර) කොන්ක්‍රිට් කිරිම | **89,969** | **04** |
| **(ii)** | වැල්ගාල ගම්මැද්ද පාර I අදියර කුට්ටි ගල් ඇල්ලිම | **88,288** | **04** |
| **(iii)** | වැල්ගාල ගල් කොටුව මාර්ගයේ කුට්ටිගල් ඇල්ලීම | **88,288** | **04** |

**2.5** අයවැය පාලනය

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) **1987** අංක **15** දරන ප්‍රාදේශිය සභා පනතේ **170** වගන්තියට අනුව අයවැය ලේඛණයේ සඳහන් සිමා නොඉක්මවන පරිදි වියදම් දැරිම සභාපතිවරයාට කළ හැකි වුවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ සඳහන් අනුමත පුනරාවර්ථන වියදම රු.**21,550,800** ක් වූ අතර එම වියදම ඉක්මවා රු. **826,680** ක වියදමක් දරා තිබුණි.

(ආ) අවස්ථා **70** කදි රු. **353,100** ක වියදම් සඳහා ප්‍රතිපාදනය සලසා තිබුනද ඊට අදාළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

**2.6** අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.** පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) තොග පාලනය

(ඉ) ණයගැති ණයහිමි පාලනය